# ශාසනාවතරණය

මහාචාර්ය

## රේරුකානේ චන්දවිමල

(සාහිත්‍ය චක්‍රවර්ති, පණ්ඩිත, ප්‍රවචන විශාරද,
අමරපුර මහා මහෝපාධ්‍යාය ශාසන ශෝභන, ශ්‍රී සද්ධර්ම ශිරෝමණී)
**මහානායක ස්වාමිපාදයන් වහන්සේ විසින්**
සම්පාදිතයි.

රේරුකානේ චන්දවිමල මහනායක හිමියන් විසින් රචිත **ශාසනාවතරණය** නමැති පොතෙන් " පැවිදි කිරීමට සුදුසු නොසුදුසු පුද්ගලයෝ" යන මාතෘකාව යටතේ ලියවී තිබුනු පිටු අංක **35** සිට **37** දක්වා පිටු පිටපත් කර ධම්ම දානයක් ලෙසට මෙසේ ඉදිරිපත් කරණ ලදී. **– dhammikaweb**

http://www.dhammikaweb.com/

## පැවිදි කිරීමට සුදුසු නුසුදුසු පුද්ගලයෝ

සැමදෙනා ම පැවිදි කිරීමට සුදුස්සෝ නො වෙති. එබැවින් පැවිදි කරන ගුරුවරයන් විසින් සුදුස්සන් පමණක් තෝරා පැවිදි කළ යුතුය.

පණ්ඩකයාය, උභතෝව්‍යඤ්ජනකයා ය, ථෙය්‍ය සංවාසකයා ය, තිත්ථියපක්කන්තකයා ය, තිරශ්චීනයාය; මාතෘඝාතකයා ය, පීතෘඝාතකයා ය. අරහන්තඝාතකයා ය. ලෝහිතුප්පාදකයා ය. සංඝභේදකයා ය,. භික්ඛුණී දූෂකයා ය යන එකොළොස් දෙන පැවිද්ද ලැබීමට සම්පූර්ණයෙන් ම නුසුදුසු අභව්‍ය පුද්ගලයෝ ය. නො දැන ඔවුන් පැවිදි කළත් ඔවුනට මහණකම නො පිහිටන්නේ ය. නො දැනීමකින් ඔවුන් පැවිදි කර ඇති නම් දැනගත් විට සිවුරු හරවා යැවිය යුතුය. යම්කිසි භික්ෂුවක් විසින් දැන ඔවුන් පැවිදි කළහොත් ඒ භික්ෂුවට ඇවැත් වේ.

“න භික්ඛවෙ, හත්ථච්ඡින්නො පබ්බාජෙතබ්බො, න පාදච්ඡින්නො පබ්බාජෙතබ්බො” යනාදීන් තවත් හත්ථච්ඡින්නාදි පුද්ගලයන් දෙතිස් දෙනකු පැවිදි නො කළ යුතු බව වදරා තිබේ. යම්කිසි භික්ෂුවක් විසින් ඔවුන් ගෙන් එකකු පැවිදි කළ හොත් ඔහුට මහණකම පිහිටයි. එහෙත් පැවිදි කළ භික්ෂුවට ඇවැත් වේ. කියන ලද දෝෂයන්ගෙන් මිදුණු පුද්ගලයකු වුවද “න භික්ඛවෙ අනනුඤ්ඤාතො මාතා පිතූහි පුත්තො පබ්බාජෙතබ්බො. යො පබ්බජෙය්‍ය ආපත්ති දුක්කටස්ස” යි තථාගතයන් වහන්සේ වදරා ඇති බැවින් මාපියන්ගේ අනු දැනීමක් නැති පුත්‍රයා ද පැවිදි නො කළ යුතුය. පැවිදි කරනු ලැබුවහොත් ඔහුට ද මහණකම පිහිටයි. පැවිදි කළ භික්ෂුවට දුකුලා ඇවැත් වේ.

විනයෙහි දක්වා ඇති ඉහත කී ප්‍රව්‍රජ්‍යා දෝෂ හැර පැවිදි කිරීම සම්බන්ධයෙන් තවත් සැලකිය යුතු බොහෝ කරුණු ඇත්තේ ය. ශිෂ්‍යයන් පැවිදි කරන ආචාර්‍ය්‍යවරයන් විසින් ඒ කරුණු ගැනත් සලකා බලා පැවිද්දට සුදුස්සන් තෝරා ගත යුතුය. නොයෙක් හේතූන් නිසා නොයෙක් අදහස්වලින් පැවිදි වන්නට උත්සාහ කරන්නෝ වෙති. තමන් ගේ මා පියන් සහෝදර සහෝදරියන් සමඟ ද සමඟියෙන් යහතින් නො විසිය හැකි ඇතැම් නොහික්මුණු අය

http://www.dhammikaweb.com/

අන්‍යයන් හා සමගියෙන් නො විසිය හැකි නිසා ම පැවිදි ජීවිතයට බැස ගැනීමට උත්සාහ කරති. තවත් සමහරු බලාපොරොත්තු කඩවීම් වලින් වූ සිත් වේදනාව නිසා පැවිදි වන්නට උත්සාහ කරති. සමහරු යම් යම් උත්පත්ති දෝෂ නිසා ඥතීන් විසින් නො පිළිගන්නා බැවින් ද පහත් කොට සලකන බැවින් ද පැවිදි වන්නට උත්සාහ කරති. සමහරු සිවුරට මුවා වී යම් යම් නොමනා අදහස් ඉටු කර ගැනීමේ අදහසින් පැවිදි වන්නට උත්සාහ කරති. සමහරු පහසුවෙන් ජීවත් විය හැකි වෙතියි සිතා පැවිදි වන්නට උත්සාහ කරති. සමහරු තමන්ගේ යම්කිසි අදහසක් ඉටු කර ගන්නා රිසියෙන් දරුවන් පැවිදි කර වන්නට උත්සාහ කරති. අතීතයේ දී පැවිදි ව රහත් වූ ද ධ්‍යානාභිඥ උපදවා ආකාශ ගමනාදි අද්භූත දේ සිදුකළා වූ ද උත්තම පුද්ගලයන්ගේ චරිත අසා හෝ පොතපතින් කියවා හෝ පැවිදි වුව හොත් තමන්ටත් ඒ තත්ත්වයට පැමිණිය හැකි වෙතියි සිතා ඇතැමෙක් පැවිදි වන්නට තැත් කරති. මෙසේ නො මනා අදහස්වලින් මෝඩ අදහස් වලින් පැවිදි වන්නට එන්නන් පැවිදි කළ හොත් ගුරුවරුන්ටත් අන්‍ය භික්ෂූන්ටත් සමහර විට ඔවුන් ගෙන් බොහෝ කරදර පැමිණිය හැකි ය. විහාරස්ථානවල දායකයන්ට පවා කරදර පැමිණිය හැකි ය. එබැවින් කියන ලද පුද්ගලයන් ද පැවිද්දට නුසුදුසු බව කිය යුතුය.

සසර දුකින් මිදී නිවනට පැමිණීමේ බලාපොරොත්තුවෙන් ශ්‍රද්ධාවෙන් ම පැවිදි වන්නට තැත් කරන අය අතර ද කිසිවකුට කීකරු කරගත නො හෙන දරුණු අසත්පුරුෂ පුද්ගලයෝ ද වෙති. ශ්‍රද්ධාව වනාහි කලින් කල අඩු වැඩි වන ඇති නැති වන ධර්මයෙකි. එය පෘථග්ජන පුද්ගලයන් කෙරෙහි සෑම කල්හි එක පමණට නො පවතී. අසත්පුරුෂයා ඔහු තුළ ශ්‍රද්ධාව උත්සන්නව තිබෙන තුරු හොඳ පැවිද්දකු වශයෙන් සිටී. ශ්‍රද්ධාව හීන වූ පසු නැති වූ පසු ඔහුගේ නපුරු ගති මතු කරන්නට පටන් ගනී. සමහර විට එබඳු අය පැවිදි ව පසු කාලයේ දී භාජන ටිකත් බිඳ දමා පන්සලටත් ගිනි තබා පලා ගිය මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේගේ ගෝලයා මෙන් ගුරුවරුන්ට හා අන්‍ය භික්ෂූන්ටත් මහත් අනර්ථ කරන්නාහ.

සසර දුකින් මිදී නිවන් පුරයට පැමිණීමේ අදහසින් පැවිදි වන්නට එන අය අතුරෙන් ද පැවිදි කළ යුතු අය ඉවසීම ඇති,

http://www.dhammikaweb.com/

අන්‍යයන් හා සමගියෙන් වාසය කළ හැකි, සාධාරණ අදහස් ඇති, මෛත්‍රී කරුණා ගුණ ඇති, ගුරුන් ගේ අවවාදනුශාසනා ආදරයෙන් පිළිගන්නා ස්වභාවය ඇති, ගුරු ගෞරවය ගුරු භක්තිය ඇති අවංක සත්පුරුෂ යෝය. එබඳු පුද්ගලයෝ ම මේ බුදුසස්නෙහි දියුණුවට පැමිණෙන්නාහ. බුදු සස්න බබලවන්නෝ ද ඔවුහු ම ය.